# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2011/7 - 2017 මාර්තු මස 20 වැනි සඳුදා - 2017.03.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 277/40

**(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**

16 වැනි වගන්තිය යටතේ වූ නියමය

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 16 වන වගන්තිය මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් වන මා විසින්, මේ නියමය මඟින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ස්මාරක ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා ''පැරණි ස්මාරක'' වශයෙන් සලකනු ලැබිය යුතු බව ප්‍රකාශයට පත් කරමි.

අකිල විරාජ් කාරියවසම්,
අධ්‍යාපන අමාත්‍ය

2017 මාර්තු මස 08 වැනි දින.
කොළඹ දී ය.

*උපලේඛනය*

*ප්‍රකාශයට පත්කරනු ලබන පැරණි ස්මාරක ලේඛනය*

**වයඹ පළාත**

01. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අංක 629 බී කුරිඤ්ඤම්පිටිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සම්මට්ටවාඩිය ග්‍රාමයට අයත් අංක PP 7711/1 අංක 7 අතිරේක ඉඩමේ අල්ලිරාණි මාළිගය නමින් හඳුන්වන ස්ථානයේ ඇති පැරණි දගැබ් ගොඩැල්ල සහ සියළුම ගොඩනැගිලි නටබුන් ස්ථාන.


1A - G 0 25316 - 17 (2017/03)
මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

02. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 836 කුරුණෑගල නගරය ඊසාන සහ අංක 840 කුරුණෑගල නගරය කඩවීදිය යන ග්‍රාම නිලධාරි වසම්වලට අයත් කුරුණෑගල නගරයේ මාළිගා පරිශ්‍රය නමින් හඳුන්වන ස්ථානයට උතුරු හා දකුණු දෙසින් පිහිටා ඇති පැරණි බැමි.

03. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1449 පහළ කිණියම ග්‍රාම නිලධාරි වසමට අයත් රිදීගම ග්‍රාමයේ පිහිටි එගොඩපිටිය නමින් හඳුන්වන ස්ථානයේ ඇති පැරණි බිසෝකොටුව.

04. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1575 මත්තේගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මත්තේගම ග්‍රාමයට අයත් යකාබැදිඇල්ල නමින් හඳුන්වන පැරණි වේල්ල.

05. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1042 දඹදෙණිය දකුණ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගලබඩ ග්‍රාමයට අයත් දඹදෙණිය මාළිගාගල නමින් හඳුන්වන ස්ථානයේ ඇති ඇතුල් ප්‍රාකාරය.

06. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නීරම්මුල්ල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි නීරම්මුල්ල ග්‍රාමයට අයත් වීරබාගල නමින් හඳුන්වන ස්ථානයේ ඇති ස්ථූප ගොඩැල්ල, ගොඩනැගිලි සාධක, පොකුණ සහ වෙනත් පුරාවිද්‍යාත්මක සාධක සහිත ගල්තලාව.

07. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 260 දෙහැන්නක්ගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පච්චලැව ග්‍රාමයට අයත් නෙළුම් පොකුණ රජමහා විහාර භූමියේ ඇති ස්ථූප නටබුන් සහ ගොඩනැගිලි සාධක සහිත ගල්තලාව.

**බස්නාහිර පළාත**

08. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 505 මල්පුර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මල්පුර ග්‍රාමයට අයත් බෝවන රෝග රෝහලේ (උණ රෝහල) පරිශ්‍රයේ ඇති පැරණි අශ්වගාල ගොඩනැගිල්ල, වසූරිය රෝගීන්ගේ වාට්ටු ගොඩනැගිල්ල, ප්‍රධාන රෝහල් ගොඩනැගිල්ල, අනෙක් පැරණි වාට්ටු ගොඩනැගිලි, පැරණි වෛද්‍යාධිකාරි නිල නිවස, වෛද්‍ය නිල නිවස, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, පැරණි නේවාසික ගොඩනැගිලි ඇතුළු අනෙකුත් පෞරාණික ගොඩනැගිලි.

**උතුරුමැද පළාත**

09. උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 156 නිකවැව ග්‍රාම නිලධාරි වසමට අයත් නිකවැව ග්‍රාමයේ (උතුරු අක්ෂාංශ $7^0$ 58' 35.4" හා නැගෙනහිර දේශාංශ $80^0$ 58' 38.8" දරණ ස්ථානයේ) පිහිටි නිකවැව පැරණි බිසෝකොටුව.

10. උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 286 සිංහපුර ග්‍රාම නිලධාරි වසමට අයත් පැරකුම්යාය ග්‍රාමයේ (උතුරු අක්ෂාංශ $8^0$ 03' 10.2" හා නැගෙනහිර දේශාංශ $81^0$ 16' 56.8" යන ස්ථානයේ) පිහිටි බෝධිගොඩආර ගොඩ සොරොච්ච.

11. උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 282 කුරුළුබැද්ද ග්‍රාම නිලධාරි වසමට අයත් කුරුළුබැද්ද ග්‍රාමයේ (උතුරු අක්ෂාංශ $8^0$ 03' 01.1" හා නැගෙනහිර දේශාංශ $81^0$ 17' 06.8" යන ස්ථානයේ) පිහිටි බෝධිගොඩආර මඩ සොරොච්ච.

12. උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 197 මැදමළුව ග්‍රාම නිලධාරි වසමට අයත් ඕනෑගම ග්‍රාමයේ (උතුරු අක්ෂාංශ $7^0$ 58' 12.8" හා නැගෙනහිර දේශාංශ $81^0$ 04' 58.1" යන ස්ථානයේ) පිහිටි ඕනෑගම ගල් සොරොච්ච.

13. උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 114 තිස්සපුර ග්‍රාම නිලධාරි වසමට අයත් තිස්සපුර යාය 01 ග්‍රාමයේ (උතුරු අක්ෂාංශ $8^0$ 08' 38.5" හා නැගෙනහිර දේශාංශ $80^0$ 56' 48.9" යන ස්ථානයේ) පිහිටි කට්ටකුලම ගල් සොරොච්ච.

14. උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 87 මැදිරිගිරිය ග්‍රාම නිලධාරි වසමට අයත් මැදිරිගිරිය ග්‍රාමයේ (උතුරු අක්ෂාංශ $8^0$ 08' 22.9" හා නැගෙනහිර දේශාංශ $80^0$ 57' 41.2" යන ස්ථානයේ) පිහිටි කවුඩුළුඔය අමුණ.

15. උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 257 ජයපුර දේවගල ග්‍රාම නිලධාරි වසමට අයත් යාය 09 ග්‍රාමයේ ඇති (උතුරු අක්ෂාංශ $7^0$ 58' 35.4" හා නැගෙනහිර දේශාංශ $80^0$ 58' 38.8" යන ස්ථානයේ) පිහිටි ජයපුර දේවගල බිසෝකොටුව සහ සොරොව්ව.

16. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 301 අශෝකාරාමය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි අශෝකාරාමය ග්‍රාමයට අයත් හල්පානු ඇළ හරහා නිර්මාණය කර ඇති පැරණි ගල්පාලම සහ පිවිසුම් මාර්ගය.

17. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 44 පුහුදිවුල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ඇටඹගස්කඩ ග්‍රාමයට අයත් ඇටඹගස්කඩ නමින් හඳුන්වන කැළෑව තුළ පිහිටා ඇති පැරණි දගැබ සහ ගොඩනැගිලි නටඹුන් ස්ථාන සහිත අනෙකුත් පුරාවිද්‍යාත්මක සාධක විසිරී ඇති නටඹුන් සංකීර්ණය.

18. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 44 පුහුදිවුල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ඇටඹගස්කඩ ග්‍රාමයට අයත් ඇටඹගස්කඩ වැව, වැව් බැම්ම සහ එම වැව ආසන්නයේ පිහිටා ඇති ටැම් ලිපිය.

19. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 02 පදවිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ඉසිපතනැව ග්‍රාමයට අයත් ඉසිපතනාගම ගල්කන්ද නමින් හඳුන්වන ස්ථානයේ ඇති පර්වත ලිපිය සහ කේතුකාවාට සහිත ගල්තලාව.

20. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 36 කහටගොල්ලෑව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මාවතවැව ග්‍රාමයේ ඇති තම්මැන්න කන්ද නමින් හඳුන්වන කඳුවැටිය සහ ඒ ආසන්නයේ ඇති පර්වත ලිපි ප්‍රතිමාගෘහය, චෛත්‍ය පියගැටපෙළ, ප්‍රාකාර බැම් සහ ගොඩනැගිලි නටබුන් සහිත පුරාවිද්‍යා ස්ථානය.

21. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 301 අශෝකාරාමය ග්‍රාම නිලධාරි වසමට අයත් මල්වතු ඔය හරහා වැටී ඇති ගල් පාලම සහ එයට අයත් අනෙකුත් පුරාවිද්‍යාත්මක සාධක සහිත භූමි ප්‍රදේශය.

22. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මිහින්තලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 565 ඉහළගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගල්මඩුව ග්‍රාමයට අයත් සුළු ගුළු චේතියාරාම පුරාණ විහාර භූමියේ ඇති පැරණි දගැබ, ටැම්පිට විහාරය, ගොඩනැගිලි නටබුන් සහ අනෙකුත් පුරාවිද්‍යාත්මක සාධක සහිත භූමිය.

23. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 233 කිරිඉබ්බෑව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කිරිඉබ්බෑව ග්‍රාමයට අයත් දිවුල්වැව වන රක්ෂිතය තුළ ඇති පාන්බට්ටියාගම ගල්වැටිය නමින් හඳුන්වන ස්ථානයේ ඇති කටාරම් සහිත ලෙන් පිහිටි ගල්වැටිය.

24. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මිහින්තලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 581 මරදංකල්ල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මරදංකල්ල ග්‍රාමයට අයත් මරදංකල්ල ටැම්පිට විහාරය නමින් හඳුන්වන ස්ථානයේ ඇති පැරණි දගැබ; ටැම්පිට ගොඩනැගිල්ල සහ පොකුණ සහිත නටඹුන් ස්ථානය.

25. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 112 කාටුපුලියන්කුලම ග්‍රාම නිලධාරි වසමට අයත් පලුකුඹුරවැව සේනාසන භූමියේ ඇති පර්වත ලිපිය, කේතුකාවාට සහිත ගල්තලාව සහ ගොඩනැගිලි නටඹුන් ස්ථානය.

26. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මිහින්තලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 576 කහපත්විලගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කහපත්විලගම ග්‍රාමයට අයත් පල්ලන්කුලමාරාමය භූමියේ පිහිටා ඇති පැරණි දගැබ.

27. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 287 ඇලයාපත්තුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ඇලයාපත්තුව ග්‍රාමයට අයත් නිවාස 32 නමින් හඳුන්වන ස්ථානයේ ඇති පැරණි දගැබ සහ ගොඩනැගිලි අවශේෂ සහිත භූමිය.

28. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 635 කුඹුක්වැව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කුඹුක්වැව ග්‍රාමයට අයත් පිළිමබැඳි ගල්ලෙන් විහාර භූමියේ ඇති කටාරම් සහිත ලෙන්, කේතුකාවාට, පැරණි පොකුණ ඇතුළු පුරාවිද්‍යාත්මක සාධක සහිත ගල්තලාව.

29. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 235 මහගල්කන්දේගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කංහිදිගම ග්‍රාමයට අයත් පුරාණ ගල්ලෙන් විවේක සේනාසන භූමියේ ඇති කටාරම් සහිත ලෙන්, පැරණි පොකුණ සහ කේතුකාවාටය සහිත ගල්වැටිය.

30. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 250 නුවර වැවවත්ත ග්‍රාම නිලධාරි වසමට අයත් නුවර වැවවත්ත නමින් හඳුන්වන ප්‍රදේශයේ ඇති තෙළුවිල පුරාවිද්‍යා රක්ෂිත භූමිය ඉදිරිපිට ඉඩමේ ඇති පැරණි ගොඩනැගිලි නටඹුන්.

31. උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 282 මහින්දගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කුරුළුබැද්ද ග්‍රාමයට අයත් පැරණි ස්ථූප නටබුන්, ගොඩනැගිලි නටබුන්, කටාරම් සහ සිතුවම් සහිත සියළුම ලෙන් සහ අනෙකුත් පුරාවිද්‍යාත්මක සාධක සහිත කවුඩාගල පුරාවිද්‍යා ස්ථානය.

32. උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 282 මහින්දගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කුරුළුබැද්ද ග්‍රාමයට ග්‍රාමයට අයත් පන්සලගල නමින් හඳුන්වන ස්ථානයේ ඇති ගොඩනැගිලි නටබුන්, ස්ථූප නටබුන්, කටාරම් සහ ශිලා ලේඛන සහිත ලෙන්.

**දකුණු පළාත**

33. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 317 සී ලේන්බටුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ලේන්බටුව අම්බලම.

34. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 96 ඩී ගාලු කොටුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගාලු කොටුව තුළ ඇති රැජිණ වීදියේ වරිපනම් අංක 02 දරණ ස්ථානයේ ඇති කළු කොටුව සහ එයට අයත් පැරණි ගොඩනැගිලි.

35. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 96 ඩී ගාලු කොටුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගාල්ල කොටුව තුළ ඇති රැජිණ වීදියේ වරිපනම් අංක (01) 36, (01)38 හා පල්ලිය වීදියේ වරිපනම් අංක (01)11, (01)13 දරණ ස්ථානයේ ඇති ඕලන්ද බඩු ගබඩාව නමින් හඳුන්වන පැරණි ගොඩනැගිල්ල.

36. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 96 ඩී ගාලු කොටුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගාලු කොටුව තුළ ඇති රැජිණ වීදියේ වරිපනම් අංක (01) 03 දරණ ස්ථානයේ ඇති දැනට පුරාවිද්‍යා දෙපාර්තමේන්තු කාර්යාලය පවත්වාගෙන යනු ලබන පැරණි ගොඩනැගිල්ල.

37. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 96ඩී ගාලු කොටුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගාලු කොටුව තුළ ඇති රෝහල් වීදියේ වරිපනම් අංක 01 දරණ ස්ථානයේ ඇති බ්‍රිතාන්‍ය රෝහල් ගොඩනැගිල්ල.

38. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 96ඩී ගාලු කොටුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගාලු කොටුව තුළ ඇති පල්ලිය වීදියේ වරිපනම් අංක 08 දරණ ස්ථානයේ ඇති ජාතික කෞතුකාගාරය පවත්වාගෙන යනු ලබන පැරණි ගොඩනැගිල්ල.

39. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 96ඩී ගාලු කොටුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගාලු කොටුව තුළ ඇති පල්ලිය වීදියේ වරිපනම් අංක 18 දරණ ස්ථානයේ ඇති තැපැල් කාර්යාල ගොඩනැගිල්ල.

40. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 96 ඩී, ගාලු කොටුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගාලු කොටුව තුළ ඇති පෙඩ්ලර් වීදියේ වරිපනම් අංක 64/62 ඒ දරණ ස්ථානයේ ඇති මහ නගර සභාවට අයත් පැරණි වෙළෙඳ ගොඩනැගිලි ද්විත්වය සහ ඕලන්ද තාප්පය.

41. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 96 ඩී, ගාලු කොටුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගාලු කොටුව තුළ ඇති මැද වීදියේ වරිපනම් අංක 38 දරණ ස්ථානයේ පිහිටි සවුත්ලන්ඩ් විද්‍යාල භූමියට අයත් පැරණි ඕලන්ද ගොඩනැගිල්ල සහ දිසානායක ගොඩනැගිල්ල.

42. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 96 ඩී, ගාලු කොටුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගාලු කොටුව තුළ ඇති මැද වීදියේ ඕල්සෙන්ට්ස් විද්‍යාල භූමියේ ඇති පැරණි ගොඩනැගිල්ල.

43. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 96 ඩී, ගාලු කොටුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගාලු කොටුව තුළ පිහිටි රැම්පාට් වීදියේ වරිපනම් අංක 04 දරණ ස්ථානයේ ඇති මහාමාර්ග දෙපාර්තමේන්තුවට අයත් පැරණි ගොඩනැගිල්ල.

44. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 96 ඩී, ගාලු කොටුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගාලු කොටුව තුළ ඇති රැම්පාට් වීදියේ වරිපනම් අංක 06 දරණ ස්ථානයේ ඇති පැරණි ගොඩනැගිල්ල.

45. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 96 ඩී, ගාලු කොටුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගාලු කොටුව තුළ ඇති රැම්පාට් වීදියේ වරිපනම් අංක 12 දරණ ස්ථානයේ ඇති පැරණි වෙඩි බෙහෙත් හෝ අවි ගබඩාව.

46. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 96 ඩී, ගාලු කොටුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගාලු කොටුව තුළ ඇති රැජිණ වීදියේ ඇති පැරණි නාගරික වෙළඳුන්ගේ නිවාසය.

**මධ්‍යම පළාත**

47. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගලගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගලබාව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගලබාව ග්‍රාමයට අයත් වෙහෙරගල රජමහා විහාර භූමියේ ඇති ලෙන් විහාර සහ ගල්තලාව මත ඇති පියගැටපෙළ.

48. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වරාතැන්න ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වරාතැන්න ග්‍රාමයේ අයත් පැරණි සොරොව්වේ නටඹුන් සහ ගල්පිළ.

49. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාරම්පනාව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි නාරම්පනාව ග්‍රාමයට ඇති එගොඩගම්මැද්ද අම්බලම.

**නැගෙනහිර පළාත**

50. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 228 - ඊ සිරාජ් නගරය ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ග්‍රාමයට අයත් සිරාජ් ළමා උද්‍යානය පිහිටි ස්ථානයේ ඇති පැරණි දාගැබ. (උතුරු අක්ෂාංශ 8° 27' 57" හා නැගෙනහිර දේශාංශ 81° 04' 59.2" යන ස්ථානයේ).

51. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 228 - සී ගල්මැටියාව දකුණ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පරවිපන්චන් ග්‍රාමයට (95 ග්‍රාමය) අයත් පරවිපන්චන් වැව ඉස්මත්තේ ගල්පර්වතය මත ඇති දාගැබ් ගොඩනැගිල්ල, ගොඩනැගිලි නටඹුන්, පොකුණු, ප්‍රාකාරය සහිත කොඩිගල කන්ද සහ එම ගල්පර්වතය පාමුල සිට ආසන්නය දක්වා පුරාවස්තු විසිරී ඇති භූමි ප්‍රදේශය. (උතුරු අක්ෂාංශ 8° 26' 29.5" හා නැගෙනහිර දේශාංශ 81° 02' 26.4" යන ස්ථානයේ).

52. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 228 - සී ගල්මැටියාව දකුණ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි 96 පෙදෙස ග්‍රාමයට අයත් ගල්මැටියාව වැව් බැම්ම අසළ ගල්පර්වතයේ නිර්මාණය කර ඇති නාග සළකුණ සහිත කැටයම. (උතුරු අක්ෂාංශ 8° 28' 42" හා නැගෙනහිර දේශාංශ 81° 03' 40" යන ස්ථානයේ).

53. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 228 - එල් ගල්මැටියාව උතුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගල්මැටියාව ග්‍රාමයට අයත් ගල්පොකුණ රජමහා විහාර භූමියේ ඇති පැරණි දාගැබ් ගොඩැල්ල, පොකුණ, ශිලා කුළුණු සහිත ගොඩනැගිලි ස්ථානය සහ විහාර භූමියේ ඇති අනෙකුත් පුරාවස්තු (උතුරු අක්ෂාංශ 8° 28' 53" හා නැගෙනහිර දේශාංශ 81° 04' 36" යන ස්ථානයේ).

54. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 228 - එල් ගල්මැටියාව උතුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි සිංහපුර ග්‍රාමයට අයත් ත්‍රිකුණාමලය තඹලගමුව ප්‍රධාන මාර්ගයට යාබද කැළෑව තුළ පිහිටා ඇති සිංහකන්ද නමින් හඳුන්වන ස්ථානයේ ඇති කටාරම් කෙටූ ලෙන් (උතුරු අක්ෂාංශ 8° 31' 52.3" හා නැගෙනහිර දේශාංශ 81° 06' 05.7" යන ස්ථානයේ).

55. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 228 ගල්මැටියාව දකුණ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි 96 පෙදෙස ග්‍රාමයට අයත් මොණරකන්ද නමින් හඳුන්වන ගල්පර්වතය ආශ්‍රිතව ඇති දාගැබ් ගොඩැල්ල, ශිලා කුළුණු සහිත ගොඩනැගිලි නටඹුන්, පියගැටපෙළ සහ අනෙකුත් පුරාවස්තු විසිරී ඇති ගල්පර්වත. (උතුරු අක්ෂාංශ 8° 27' 07.1" හා නැගෙනහිර දේශාංශ 81° 03' 06.7" යන ස්ථානයේ).

56. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 228 ගල්මැටියව උතුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි උල්පත්වැව ග්‍රාමයට අයත් උල්පත්වැව රජමහා විහාර භූමියේ ඇති පැරණි චෛත්‍ය, ගොඩනැගිලි නටඹුන් සහ අනෙකුත් පුරාවිද්‍යාත්මක සාධක. (උතුරු අක්ෂාංශ 8° 27' 07.1" හා නැගෙනහිර දේශාංශ 81° 03' 06.7" යන ස්ථානයේ).

57. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 228 සී ගල්මැටියාව දකුණ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි 97 පෙදෙස ග්‍රාමයට අයත් ගල්මැටියාව රජමහා විහාර භූමියේ ඇති ශිලා කුළුණු සහිත ගොඩනැගිලි

නටබුන් ස්ථාන සහ අනෙකුත් පුරාවිද්‍යාත්මක සාධක. (උතුරු අක්ෂාංශ 8° 28' 27.1" හා නැගෙනහිර දේශාංශ 81° 03' 34.9" යන ස්ථානයේ).

58. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 228 එෆ් මොල්ලිපොතාන ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සාලියපුර ග්‍රාමයට අයත් සාලියපුර පැරණි වැව් බැම්ම. (උතුරු අක්ෂාංශ 8° 23' 28.3" හා නැගෙනහිර දේශාංශ 81° 30' 42.5" යන ස්ථානයේ).

04 - 26

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.